# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 2009 අංක 52 දරන ශ්‍රී ලංකා සත්ව අවිහිංසා සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත

---

**[සහතිකය සටහන් කළේ 2009 සැප්තැම්බර් මස 25 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---


2009 සැප්තැම්බර් මස 25 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ :** රු. **6.00 යි.** තැපැල් ගාස්තුව **:** රු. **5.00 යි.**

# 2009 අංක 52 දරන ශ්‍රී ලංකා සත්ව අවිහිංසා සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2009 සැප්තැම්බර් මස 25 වන දින]

එල්. ඩී.—ඕ. (අයි.එන්.සී) 26/2007.

## ශ්‍රී ලංකා සත්ව අවිහිංසා සමිතිය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

පූර්විකාව.

"ශ්‍රී ලංකා සත්ව අවිහිංසා සමිතිය" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන සංගමයක්, එකී සංගමයට සම්බන්ධ සියලු පරමාර්ථ හා කාරණා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබුණු හෙයින් ද:

එකී පදනම පිහිටුවනු ලැබුවේ කවර පරමාර්ථ හා කාරණා සඳහා ද, ඒ පරමාර්ථ හා කාරණා මෙතෙක් කල් එකී සංගමය විසින් මේ දක්වා සාර්ථක ලෙස ක්‍රියාත්මක කරනු ලැබ හා ඉටු කරනු ලැබ ඇති හෙයින් ද, එම සංගමය සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති හෙයින් ද, ඒ ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 2009 අංක 52 දරන ශ්‍රී ලංකා සත්ව අවිහිංසා සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වූ දින සිට සහ ඉන් පසුව (මෙහි මින් මතු "සමිතිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා සත්ව අවිහිංසා සමිතියේ දැනට සාමාජිකයන්ව සිටින තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු සාමාජිකයන් වශයෙන් බඳවා ගනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "ශ්‍රී ලංකා සත්ව අවිහිංසා සමිතිය" යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු ය. තව ද එකී නාමයෙන් ඒ සංස්ථාව විසින් ද, එයට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද, එය පාවිච්චි කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද, පූර්ණ බලය සහ අධිකාරිය ඒ සංස්ථාවට ඇත්තේ ය. ශ්‍රී ලංකා සත්ව අවිහිංසා සමිතිය සංස්ථාගත කිරීම.

2-PL 003823—2,650 (2009/04)

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාව පිහිටුවනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) සතුන් ආරක්ෂා කිරීම සඳහා ඇති අවශ්‍යතාවය පිළිබඳව මිනිසුන් අතර දැනුවත්භාවයක් ඇති කිරීම;

(ආ) සතුන් නොසලකා හැරීම හෝ සතුන්ට අනවශ්‍ය වේදනාවක් හෝ පීඩාවක් ඇතිකිරීමෙන් වැලකී සිටීමේ අවශ්‍යතාවය සම්බන්ධව මිනිසුන් දැනුවත් කිරීම;

(ඇ) සතුන් රැකබලා ගැනීම සඳහා පියවර ගැනීම සහ පරිසරය සංරක්ෂණය කිරීමේ වැදගත්කම ගැන මිනිසුන් තුළ අවබෝධයක් ඇති කිරීම;

(ඈ) ගෘහාශ්‍රිතව ඇති කරන සතුන් සඳහා මනා පරිසරයක් ඇති කිරීම සහ ඔවුන්ට ආරක්ෂාව සැලසීම;

(ඉ) රෝගී සතුන් සඳහා නේවාසික හා බාහිර වෛද්‍ය ප්‍රතිකාර සැපයීම; සහ

(ඊ) සතුන්ට ආදරය සහ කරුණාව දැක්වීමට මහජනයා පෙළඹවීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

4. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව සංස්ථාවට පහත සඳහන් බලතල තිබිය යුතු ය:—

(අ) දේශීය හෝ විදේශීය ප්‍රභවයන්ගෙන්, මුදලින් හෝ ද්‍රව්‍ය වලින් ලැබෙන ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග භාර ගැනීම ;

(ආ) බැංකු ගිණුම් විවෘත කිරීම, පවත්වාගෙන යාම, ක්‍රියාත්මක කිරීම සහ වැසීම සහ ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීම හෝ ඉපයීම;

(ඇ) විධායක කමිටුව විසින් තීරණය කරනු ලබන සුරැකුම්පත්වල සංස්ථාවට අයත් මුදල් ආයෝජනය කිරීම ;

(ඈ) සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීමේ කාර්ය සඳහා අවශ්‍ය වන නිලධරයන් සහ සේවකයන් පත් කිරීම, සේවයේ නියුක්ත කිරීම, ඔවුන්ට පාරිශ්‍රමික ගෙවීම, ඔවුන් සම්බන්ධයෙන් විනය පාලනය කිරීම සහ සේවයෙන් පහ කිරීම;

(ඉ) සංස්ථාවේ පරමාර්ථ වලට සමාන පරමාර්ථ ඇති වෙනත් සංගම්, සමිති හෝ සංවිධාන සමග සහයෝගයෙන් කටයුතු කිරීම සහ සම්බන්ධකම් පැවැත්වීම;

(ඊ) සංස්ථාවේ අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා ප්‍රදර්ශන, දේශන, සම්මන්ත්‍රණ, වැඩමුළු, සම්මේලන සහ සංචාර ප්‍රවර්ධනය කිරීම, සංවිධානය කිරීම සහ පැවැත්වීම ; සහ

(උ) සංස්ථාවේ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා ආනුෂංගික වන හෝ අවශ්‍ය වන වෙනත් සියලු ක්‍රියා සහ දේ කිරීම.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

5. (1) 7 වන වගන්තිය යටතේ සාදන ලද රීති වලට යටත් ව, අනුශාසක වරුන්, සභාපතිවරයා, උපසභාපතිවරු දෙදෙනා, මහ ලේකම්, සහකාර ලේකම්, භාණ්ඩාගාරික, භාරකාර මණ්ඩලයේ සාමාජිකයන් සහ එම රීති මගින් විධිවිධාන සලසා ඇති සහ ඒවාට අනුව තෝරා පත් කරගනු ලබන දොළොස් දෙනකුට අඩු නොවන වෙනත් සාමාජිකයන්ගෙන් සැදුම්ලත් විධායක කමිටුවක් විසින් පරිපාලනය කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ ප්‍රථම විධායක කමිටුව, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනට පෙරාතුව ම වූ දිනයේ දී ධුර දරන සමිතියේ විධායක කමිටුවෙන් සමන්විත විය යුතු අතර, ඔවුන් සංස්ථාවේ රීති යටතේ පත් කරනු ලබන නව විධායක කමිටුවක් තෝරා පත් කර ගන්නා තුරු ධුර දැරිය යුතු ය.

භාරකාර මණ්ඩලය.

**6.** (1) සංස්ථාවේ භාරකාර මණ්ඩලයක් සිටිය යුතු අතර, සංස්ථාවේ දේපළවල පරිපාලනය ඒ භාරකාර මණ්ඩලය වෙත පැවරේ.

(2) සංස්ථාවේ ප්‍රථම භාරකාර මණ්ඩලය මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනට පෙරාතුව ම වූ දිනයේ දී සමිතියේ ධුර දැරුවා වූ සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු සංස්ථාවේ රීති යටතේ අලුත් භාරකාර මණ්ඩලයක් පත් කරනු ලබන තෙක් ධුර දැරිය යුතු ය.

සංස්ථාවේ රීති.

**7.** (1) පහත දැක්වෙන සියලුම කරුණු හෝ ඉන් කිසිවක් සඳහා මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති, සංස්ථාවේ යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් කලින් කල සංස්ථාව විසින් සෑදීම නීත්‍යානුකූල වන්නේ ය:—

(අ) සාමාජිකත්වය වර්ග කිරීම සහ සාමාජිකයන් ඇතුළු කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ ඔවුන් නෙරපීම ;

(ආ) සංස්ථාවේ නිලධරයන් තෝරා පත්කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම, ඔවුන් ධුරය හිස් කිරීම හෝ ධුරයෙන් නෙරපීම සහ ඔවුන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය;

(ඇ) විධායක කමිටුවේ සාමාජිකයන් තෝරා පත්කර ගැනීම සහ විධායක කමිටුවේ බලතල, කාර්යය සහ කර්තව්‍ය සහ විධායක කමිටුවේ සාමාජිකයන්ගේ ධුර කාලය;

(ඈ) භාරකාර මණ්ඩලයේ භාරකරුවන් තෝරා පත් කර ගැනීම සහ එහි බලතල, ක්‍රියා කලාපය සහ කාර්යය සහ එම භාරකරුවන්ගේ ධුර කාල;

(ඉ) සංස්ථාවේ විවිධ නිලධරයන්, අනුයෝජිතයන් සහ සේවකයන්ගේ බලතල, හැසිරීම, කාර්යය සහ කර්තව්‍ය;

(ඊ) විධායක කමිටුවේ සහ සංස්ථාවේ රැස්වීම් කැඳවීමේ දී හෝ පැවැත්වීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, එම රැස්වීම් කැඳවීම සහ පැවැත්වීම, ඒවායේ පුරප්පාඩු පිරවීම, ඒ රැස්වීම් පිළිබඳ දැන්වීම් සහ න්‍යාය පත්‍ර, ඒ රැස්වීම් සඳහා ගණපූරණය සහ ඒ රැස්වීම්වල කටයුතු කරගෙන යාම;

(උ) සංස්ථාවේ අරමුදල්වල භාරකාරත්වය සහ සංස්ථාවේ ගිණුම් පවත්වාගෙන යාම සහ ඒවා විගණනය කිරීම;

(ඌ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම.

(2) සංස්ථාව විසින් සාදනු ලැබූ යම් රීතියක් (1) වන උපවගන්තිය යටතේ ඒ රීතිය සාදනු ලැබූ ආකාරයෙන්ම සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ එය පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

**8.** (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු අතර, ත්‍යාග, තෙස්තමේන්තු නීයාදන, පැවරුම්, පරිත්‍යාග, සම්මාදම් මුදල් හෝ ගාස්තු වශයෙන් ලැබෙන සියලු මුදල් විධායක කමිටුව විසින් තීරණය කරනු ලබන බැංකු එකක හෝ වැඩි ගණනක සංස්ථාවේ නමින් තැන්පත් කරනු ලැබිය යුතු ය. සංස්ථාවේ අරමුදල්.

(2) සංස්ථාවේ දේපළ පුනරුත්ථාපනය කිරීම, සංවර්ධනය කිරීම හෝ වැඩි දියුණු කිරීම සඳහා යම් අගය ක්ෂය වීමේ අරමුදලක් හෝ නිදන් අරමුදලක් සංස්ථාව විසින් පිහිටුවනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී සංස්ථාව විසින් දරනු ලැබූ සියලු වියදම් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

**9.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ සමිතියේ පැවති සියලු ණය සහ බැරකම් සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, එදින වන විට සමිතියට අයවිය යුතු සියලු ණය, සාමාජික මුදල්, ගාස්තු සහ දායක මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය. සමිතිය විසින් ගෙවිය යුතු සහ සමිතියට අයවිය යුතු ණය.

**10.** (1) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය. විගණනය සහ ගිණුම්.

(2) විධායක කමිටුව විසින් එහි ආදායම් සහ වියදම් සහ වත්කම් හා බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව, නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) සංස්ථාව විසින් පත් කරනු ලබන සුදුසුකම් ලත් විගණකවරයකු විසින් සංස්ථාවේ ගිණුම් වාර්ෂිකව විගණනය කළ යුතු ය.

(4) මේ වගන්තියේ "සුදුසුකම් ලත් විගණකවරයා" යන්නෙන්—

(i) ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීවරයන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක සාමාජිකයකු වන්නා වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන්

වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරනු ලැබූ සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක් ; හෝ

(ii) ගණකාධිකාරී ව්‍යාපාරික සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීවරයන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක සාමාජිකයකු වන්නා වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද එවැනි වරලත් ගණකාධිකාරී සමාගමක්,

අදහස් වේ.

සංස්ථාව විසින් චංචල හෝ නිශ්චල දේපළ දැරිය හැකි බව.

11. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක් හෝ අන්තිම කැමති පත්‍රයකින් දේපළ බැහැර කිරීමක් මත හෝ අන්‍යාකාරයකින් හෝ සංස්ථාව වෙත සතු කර දෙනු ලබන චංචල හෝ නිශ්චල යම් දේපළක් අත්කර ගැනීමට සහ දැරීමට සංස්ථාවට නීතියෙහි ලා හැකියාව හා ශක්නුතාව තිබිය යුතු අතර, ඒ සියලු දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය ඇතිව 7 වන වගන්තිය යටතේ සාදන ලද සංස්ථාවේ රීති වලට යටත්ව මේ පනතේ කාර්ය සඳහා සංස්ථාව විසින් ඒ සියලු දේපළ දැරිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

12. සභාපතිවරයා සහ මහ ලේකම්වරයා හෝ භාණ්ඩාගාරිකවරයා ඉදිරිපිට දී හැර සංස්ථාවේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට සලකුණක් වශයෙන් ඔවුන් විසින් ඒ සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු ය. තව ද එම අත්සන් කිරීම, සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලබන අත්සනට පරිබාහිරව විය යුතු ය.

සංස්ථාව විසුරුවා හැරීමේදී ඉතිරිවන වන දේපළ.

13. සංස්ථාව විසුරුවා හැරීමේ දී එහි සියලු ණය හා බැරකම් ගෙවීමෙන් පසු කවර හෝ දේපළක් ඉතිරිව ඇත්නම් එම දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර නොබෙදිය යුතු නමුත්, සංස්ථාවේ පරමාර්ථ වලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර බෙදීම

තහනම් කරනු ලබන්නා වූ ද වෙනත් යම් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. සංස්ථාව විසුරුවා හරිනු ලබන අවස්ථාවේ දී හෝ ඊට පෙරාතුව ම සංස්ථාවේ සාමාජිකයන් විසින් එම ආයතනය හෝ ආයතන තීරණය කරනු ලැබිය යුතු ය.

14. ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

15. මෙම පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.